**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 24 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 19 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 26 දින සභාවේ නගරාධිපතිවරයාට නිකුත් කරන ලදි.

1.2. **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
-----------------------------------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් හා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබුණු රු.6,082,198 ක ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවිය යුතුව තිබුණු රු.313,646 ක පොලී මුදල් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ රු.313,646 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන නාගරික සංවර්ධන අධිකාරිය නමින් වූ බැංකු ගිණුමෙහි 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,656,192 ක් වුවද, එය රු.1,645,176 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.11,016 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල තානායම් කළමනාකරණ ගාස්තු ආදායම රු.1,287,000 ක් වුවද, එය රු.1,782,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම රු.495,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු කර්මාන්ත 06 ක ඇස්තමේන්තුගත හා ගිවිසුම්ගත මුදල් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සැලසීම නිසා ණයහිමියන් හා වර්ෂයේ වියදම රු.8,773,300 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 **අසම්භාව්‍ය බැරකම්**
------------------

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1971 අංක 08 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව, රථවාහන පාලක පාලිකාවන් සේවයේ යොදවාගැනීම වෙනුවෙන් 2003 ජනවාරි සිට 2013 මාර්තු 31 දක්වා කාලයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු රු.2,004,480 ක දායක මුදල් හා රු.926,125 ක අධිභාර මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 104,095,428 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.137,386,511 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.97,483,709 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සේවය හැර ගිය, විශ්‍රාම ගිය, ස්ථාන මාරුවූ හා මියගිය සේවකයින් / නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.92,799 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛය | කඩ කාමරයක් බදුගත් බදුකරු සිය කැමැත්තෙන්ම බදු ගිවිසුම අවලංගු කරගන්නා අවස්ථාවක කඩ කාමරය සභාව වෙත පවරාගෙන නැවත ටෙන්ඩර් කැඳවා බදුදීමට කටයුතු කළ යුතු වුවද, සභාව විසින් අවස්ථා 20 කදී එසේ නැවත ටෙන්ඩර් කැඳවීමකින් තොරව පැවරුම් ගාස්තුවක් පමණක් අයකර පැරණි බදුකරු විසින් එකඟවූ පුද්ගලයින් වෙත කඩ කාමර පවරා තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,540,553 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,922,196 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,618,357 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 24,330,413 | 20, 113,517 | 4,216,896 | |
| බදු කුලී | 27,017,176 | 30,819,083 | (3,801,906) | |
| බලපත්‍ර ගාස්තු | 8,340,985 | 4,439,112 | 3,901,873 | |
| සේවා සඳහා ගාස්තු | 13,072,769 | 8,966,328 | 4,106,441 | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 844,566 | 506,014 | 338,552 | |
| වෙනත් ආදායම් | 21,086,003 | 15,719,264 | 5,366,739 | |
| ආදායම් ආධාර | 59,379,831 | 42,198,429 | 17,181,402 | |
| | | | ------------- | 31,309,997 |

පුනරාවර්තන වියදම

| | | | | |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 66,746,780 | 52,894,376 | (13,852,404) | |
| ගමන් වියදම් | 2,414,188 | 685,418 | (1,728,770) | |
| සැපයුම් හා උපකරණ | 11,168,483 | 9,294,681 | (1,873,802) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු කිරීම් | 9,359,082 | 6,591,085 | (2,767,997) | |
| ප්‍රවාහන සම්බන්ධතා හා උපයෝගී සේවා | 24,033,134 | 20,608,696 | (3,424,438) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 4,857,438 | 5,815,078 | 957,640 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 1,844,507 | 1,410,053 | (434,454) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 107,577 | 540,162 | 432,585 | |
| | | | | (22,691,640) |
| | වාසිදායක විචලනය | | | 8,618,357 |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 676,230 |
| මුද්දර ගාස්තු | 1,989,180 |
| | 2,665,410 |

### 2.3.2 කඩකාමර බදු

සභාව සතු වාණිජ මධ්‍යස්ථානයේ පිහිටි කඩකාමර වලින් ලැබෙන ආදායම එහි නඩත්තු වියදම් හා වාණිජ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සඳහා පොලී ගෙවීමට තරම්වත් ප්‍රමාණවත් නොවන බැවින්, සභා අරමුදලට පාඩුවක් සිදුවී තිබූ අතර, පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කඩ කුලී තක්සේරු කර අයකිරීමට ද කටයුතු කර නොතිබුණි.

### 2.3.3 ප්‍රචාරන දැන්වීම් ගාස්තු

සභා සීමාව තුල සවිකර ඇති ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 2.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව, නව බස්නැවතුම්පල ඉදිකිරීමෙන් පසු කඩ කාමර ලබාදීමේ පදනම මත කඩහිමියන් 15 දෙනෙකුගෙන් රු.4,200,000 ක් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.5 **නිෂ්කාර්ය වත්කම්**

සභාව සතු වටිනාකම රු.2,860,266 ක් වූ වත්කම් විෂයයන් 03 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි.

2.6 **ආර්ථික නොවූ ගනුදෙනු**

රු.9,482,310 ක වටිනාකමක් සහිත ගිවිසුමකට එළඹ ආරම්භ කළ බණ්ඩාරවෙල නගර මධ්‍ය ව්‍යාපෘතිය 2014 වර්ෂය වන විට අත්හැර දමා තිබූ බැවින් ඒ සඳහා වැය කරන ලද රු.3,458,292 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

3. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

3.1 **අයවැය පාලනය**

සභාවේ 2013 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| **පුනරාවර්තන ආදායම** | | | | |
| බලපත්‍ර ගාස්තු | 5,202,100 | 8,340,985 | 3,138,885 | 60.3 |
| සේවා සඳහා ගාස්තු | 7,008,000 | 13,072,769 | 6,064,769 | 86.5 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 352,400 | 844,566 | 492,166 | 139,7 |
| වෙනත් ආදායම් | 6,950,400 | 21,086,002 | 14,135,602 | 203.4 |
| ආදායම් ආධාර | 42,497,150 | 59,379,831 | 16,882,681 | 39.7 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| පුද්ගලික පඩිනඩි | 60,329,120 | 66,746,780 | 6,417,660 | 10.6 |
| ගමන් වියදම් | 1,034,000 | 2,414,188 | 1,380,188 | 133.5 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු කිරීම් | 11,440,000 | 9,359,083 | 2,080,917 | 18.2 |
| ප්‍රවාහන සම්බන්ධතා උපයෝගී හා වෙනත් සේවා | 20,893,800 | 24,033,134 | 3,139,334 | 15.0 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 2,280,850 | 1,844,507 | 436,343 | 19.1 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 325,000 | 107,577 | 217,423 | 66.9 |

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය